# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.28 පැය 1645 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/163/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**77 වන ජාතික නිදහස් දින සැමරුම් උත්සවය හා එහි පෙරහුරු පැවැත්වෙන දිනයන්හි ක්‍රියාත්මක වන විශේෂ රථවාහන සැලැස්ම.**

2025.02.04 වන දිනට යෙදී ඇති 77 වන ජාතික නිදහස් දින සැමරුම් උත්සවයේ පෙරහුරුව පැවැත්වීමට නියමිත 2025.01.29, 2025.01.30, 2025.02.01 හා 2025.02.02 යන දිනයන්හි සහ නිදහස් දින සැමරුම් උත්සව දිනයේ කොළඹ ප්‍රදේශයේ රථවාහන ගමනාගමනය සීමා කිරීම්, මාගර් වසා තැබීම් හා විකල්ප මාගර් භාවිතා කිරීම පිළිබඳව විශේෂ රථවාහන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

ඒ අනුව නිදහස් සමරු උත්සවයේ පෙරහුරු පුහුණුවීම් කටයුතු ඉහත සඳහන් කරන ලද දිනයන්හි පාසැල් පැමිණෙන ළමුන්ට බාධාවක් සිදු නොවන අයුරින් පෙරවරු 08.00 සිට පහත සඳහන් පරිදි රථවාහන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට නියමිතය.

**<u>මාගර් වසා තැබීම / රථවාහන ගමනාගමනය සීමා කිරීම්</u>**

A. බෞද්ධාලෝක මාවත, ටොරින්ටන් හන්දියෙන් ප්‍රේමකීතර්ි ද අල්විස් මාවත දෙසට ඇතුල් වීම.

B. ආර්.එෆ්.පී. හන්දියෙන් රාජ්‍ය පරිපාලන දෙසට ඇතුල් වීම.

C. විජේරාම විද්‍යා මාවත හන්දියෙන් විද්‍යා මාවත දෙසට ඇතුල් වීම.

D. ආර්.ජී. සේනානායක මාවත, මෙට්ලන්ඩ් චන්ද්‍රවංක හන්දියෙන් නිදහස් වටරවුම දෙසට ඇතුල් වීම.

E. නිදහස් මාවත නිදහස් වටරවුමෙන් මෙට්ලන්ඩ් චන්ද්‍රවංකය දෙසට ඇතුල් වීම.

F. ස්ටැන්ලි විජේසුන්දර මාවත, පදනම් මාවත හන්දියෙන් නිදහස් මාවත දෙසට ඇතුල් වීම.

G. නිදහස් වටරවුමෙන් නිදහස් චතුරස්‍රය දෙසට ඇතුල් වීම.

H. පුස්තකාල වටරවුමෙන් හෝටර්න් වටරවුමට ඇතුල් වීම (සීමා කිරීම)

I. නිදහස් පදනම හන්දියෙන් නිදහස් මාවතට පිවිසීම.

**ගමනාගමනය සීමා කර හෝ මාගර් වසා ඇති ප්‍රදේශ මඟ හැර පහත පරිදි කොළඹට ඇතුල් විය හැකිය.**

01.නන්දා මෝටසර් දෙස සිට පැමිණෙන රථවාහන නිදහස් වටරවුමෙන් දකුණට හැරී පිලිප් ගුණවධර්න මාවත ඔස්සේ ස්ටැන්ලි විජේසුන්දර මාවතින් බෞද්ධාලෝක මාවතට ඇතුල් විය හැකිය.

02.බෞද්ධාලෝක මාවතින්, හෝටර්න් වටරවුම දෙසට පැමිණෙන වාහන සඳහා විජේරාම මාවත ඔස්සේ ගමන් කර හෝටර්න් විජේරාම ඔස්සේ හෝටර්න් පෙදෙස දෙසට ගමන් කල හැකිය.

03.විජේරාම මාවත ඔස්සේ විද්‍යා විජේරාම හන්දියෙන්, තුම්මුල්ල දෙසට ගමන් කරන රථවාහන සඳහා විද්‍යා විජේරාම හන්දිය ඔස්සේ බුලසර් විජේරාම දෙසට පැමිණ කනත්ත දෙසට සහ තුම්මුල්ල දෙසට ගමන් කල හැකිය.

**රථ ගාල් පිහිටි ස්ථාන.**

- රූපවාහිනී සංස්ථාව අසල රථගාල (සැහැල්ලු වාහන 250)
- BMICH අංක 02 දොරටුව ඇතුලත රථගාල (සැහැල්ලු වාහන 350)
- CR & FC රථගාල (සැහැල්ලු වාහන 250)
- BMICH අංක 04 දොරටුව ඇතුලත රථගාල (සැහැල්ලු වාහන 550)
- BMICH අංක 03 දොරටුව ඇතුලත රථ ගාල (සැහැල්ලු වාහන 150)
- නිදහස් මාවත ආකේඩ් රථ ගාල (සැහැල්ලු වාහන 30)
- ප්‍රේමකීතර්ී ද අල්විස් මාවත රථගාල (සැහැල්ලු වාහන 30)
- ITI රථගාල (සැහැල්ලු වාහන 75)
- නෙළුම් පොකුණ රඟහල රථගාල (බස් රථ 75)
- සරණ පාර BMICH භූමිය අවට මාගර්ය (සැහැල්ලු වාහන 230 / බස් රථ 75)

ඉහත මාගර් වසා තබන හා ගමනාගමනය සීමා කරන අවස්ථාවන් වලදී එම ප්‍රදේශවල පදිංචිකරුවන්ට රථවාහන නිලධාරීන්ගේ උපදෙස් මත ගමන් කල හැකිය.

පෙරහුරු රාජකාරි හා නිදහස් දින උත්සවය අවසන් වීමත් සමඟ රථවාහන ගමනාගමනය සඳහා ඉහත මාගර් විවෘත කිරීමේ කටයුතු කෙරෙනු ඇත. මේ සම්බන්ධයෙන් මහජනතාව හා රියදුරන් දැනුවත් කිරීම සඳහා ඔබ මාධ්‍ය ආයතන මඟින් අවශ්‍ය කටයුතු කරදෙන මෙන් ඉල්ලා සිටිමි.

**රථවාහන දළ සැලැස්ම**

# රථ වාහන විකල්ප මාර්ග වෙත යොමු කිරීම.
# (කොළඹින් පිටවීම)




# මාර්ග වසා තැබීම/ගමනාගමනය සීමා කිරීම.




- **A** බෞද්ධාලෝක මාවත ටොරින්ටන් හංදියෙන් ප්‍රේම කීර්තිද අල්විස් මාවත දෙසට ඇතුල් වීම
- **B** ආර් එෆ් පි හංදියෙන් රාජ්‍ය පරිපාලන දෙසට ඇතුල් වීම
- **C** විජේරාම විද්‍යා මාවත හංදියෙන් විද්‍යා මාවත දෙසට ඇතුල් වීම
- **D** ආර් ජී සේනානායක මාවත මේට්ලන්ඩ් චන්ද්‍රවංක හංදියෙන් නිදහස් වටරවුම දෙසට ඇතුල් වීම
- **E** නිදහස් මාවත නිදහස් වටරවුමෙන් මේට්ලන්ඩ් චන්ද්‍රවංකය දෙසට ඇතුල් වීම
- **F** ස්ටැන්ලි විජේසුන්දර මාවත මාවත පදනම් මාවත හංදියෙන් නිදහස් මාවත දෙසට ඇතුල් වීම
- **G** නිදහස් වටරවුමෙන් නිදහස් චතුරශ්‍රය දෙසට ඇතුල් වීම.
- **H** පුස්තකාල වටරවුමෙන් හෝර්ටන් වටරවුමට ඇතුල් වීම. (සීමා කිරීම)
- **I** නිදහස් පදනම හංදියෙන් නිදහස් මාවතට පිවිසීම

# රථවාහන විකල්ප මාර්ග වෙත යොමු කිරිම.
# (කොළඹට ඇතුල් වීම)




**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**